NFX COMICS

Part III

TRILOGY FINALE

COLLECTOR'S ED.

YAKKA

The First Seal

Part III · The War of the Giants



DIRECT EDITION

00131 · NFX CREATIONS


CREATED & WRITTEN BY


Nawod Madhuwantha. aka Nawwa.4X


Prequel to YAKKA: The Last Bloodline · Part III: The War of the Giants


රිටිගල සොහොන් ගැබ
කතාවේ අන්තිම රාත්‍රියේදී, හාමුදුරුවෝ පරණ යක්ෂ අකුරු කොටපු රන් පතක ඉතිරි වෙලා තිබුණු කෑල්ලක් දිගහැරියා.
හාමුදුරුවෝ
"එදා ගහපු ගිවිසුමෙන් අදට ඉතිරි වෙලා තියෙන්නේ මේ පොඩි කෑල්ල විතරයි පුතේ."
නව්වා
"ඉතින් හාමුදුරුවනේ... රජවරු ඒ පොරොන්දුව ඒ විදිහටම රැක්කද?"
FWOOSH!!
හාමුදුරුවෝ
"රැක්කා... හැබැයි ලේ ගංගාවක් මැද්දෙන්."
අනුරාධපුර බලකොටුව
"යුද්ධයක් තියෙන වෙලාවට කවුරුවත් පොළොව යට වෙන දේවල් ගැන බලන්නේ නැහැ." අනුරාධපුර බලකොටුවෙන් පිටත අඳුරේ, රතු ඇස් තියෙන පිරිසක් රහසින්ම පොළොව හාරන්න පටන් ගත්තා.
CLINK! THUD!
එළාර රජතුමාගේ මාලිගාවේ ඇමතියෙක්ගේ ඇස්වලත්, දකුණේ දුටුගැමුණු කුමාරයාගේ කඳවුරේ සෙන්පතියෙක්ගේ ඇස්වලත් එකම රතු අඳුර දිලිසුණා.
මාලිගා දෙකේම සැඟවුණු සතුරා
රජවරු දෙන්නෙක්... හැබැයි ඒ දෙන්නටම නොපෙනුණු එකම සතුරෙක්!


දස මහා යෝධයෝ
"කුමාරයා තමන්ගේ සටනට මහා යෝධයන් දස දෙනෙක්ව එකතු කරගත්තා..."



දුටුගැමුණු කුමරු සහ කණ්ඩුල ඇතා


නන්දිමිත්‍ර (අතින්ම ඇතාව මෙල්ල කළ යෝධයා)


සුරතිමල (අශ්වයන්ටත් වඩා වේගවත් සෙබළා)


ඵුස්සදේව (මහා දුනු ශිල්පියා)


ගෝඨයිම්බර (පොල් ගස් උදුරා දැමූ යෝධයා)


ථේරපුත්තාභය (සිවුර හැර සටනට ආ යෝධයා)

සැඟවුණු එකොළොස්වැන්නා
"...හැබැයි පොත්පත්වල ලියවුණේ නැති තවත් එක්කෙනෙක් හිටියා. ඒ තමයි යක්ෂ ලේ තියෙන රිටිගල ජයසේන!"

වැඩිහිටි යක්ෂණිය
"අපේ ගල් කණු ටික කොහොමහරි ආරක්ෂා කරපන්. වෙන කිසිම දෙයක් වැදගත් නැහැ!"

විජිතපුර බලකොටුව
මාස හතරක් තිස්සේ වටලෑම. දිය අගල් සහ පවුරු තුනකින් වටවුණු විජිතපුර බලකොටුව ඉස්සරහා මහා සේනාව කඳවුරු බැඳගත්තා.

දුටුගැමුණු කුමරු
"කොටු දොරටුව බිඳින්න!"

යකඩ දොරටුවට පහර දෙද්දී සතුරන් වත්කරපු උණු ලෝදියෙන් පිච්චුණු කණ්ඩුල ඇතා වතුරට පැන්නා. පස්සේ ගොන් හම්වලින් පිට ආවරණය කරපු කණ්ඩුල ආයෙත් වේගයෙන් කඩා පැන්නා!

ROOOOOAAAR!!

KRA-BOOOOM!!

දකුණු දොරටුව බිඳ වැටීම
යකඩ දොරටුව සුනුවිසුනු වුණා! ඇතාගේ ඇඟට කඩා වැටෙන්න ගිය ගල් කුළුණ නන්දිමිත්‍ර අතින්ම පැත්තකට විසි කරද්දී, සුරනිමල කෙළින්ම කොටු පවුර උඩින් පැන්නා!



නැගෙනහිර දොරටුව
නැගෙනහිර දොරටුවෙන් ගෝඨයිම්බරයි ථෙරපුත්තාභයයි ඇතුළට කඩා පනිද්දී, එයාලා ළඟින්ම සටන් කරපු ජයසේනගේ කකුල් යටින් එකපාරටම පොළොව කඩාගෙන වැටුණා!
KRA-CRACK!!
විජිතපුර පොළොව යට තිබුණු උමග ඇතුළේ එළාරගේ ද්‍රෝහී ඇමතියා හිටියා... ඊට පිටිපස්සෙන් අදුරෙන් මතු වුණේ මාර යානයේ බිහිසුණු සත්තු තුන්දෙනෙක්!
ජයසේන
"මේ... අර ඉස්සර ආපු පරණ හතුරා නේද!"
KRA-SMASH!!
හාමුදුරුවන්ගේ හඬ
"මේ සටන ගැන කිසිම ඉතිහාස පොතක ලියවිලා නැහැ." ජයසේන තනියම උන් එක්ක හැප්පිලා උමගේ ලී කණු කඩලා දැම්මා. උමග කඩා වැටෙද්දී ජයසේන ලේ පෙරාගෙන එළියට ආවා.



අනුරාධපුර දකුණු දොරටුව
අනුරාධපුර පවුර ඉස්සරහා මහා හමුදා දෙක එකට ගැටුණා! මහාපබ්බත ඇතා පිටින් සාධාරණ එළාර රජතුමා පෙරමුණට ආවා.
එළාරගේ දීඝජන්තු සෙන්පතියා අහසින් පැනලා සුරනිමලගේ පලිහ දෙකට පැළුවත්, සුරනිමලගේ හෙල්ල පහරින් දීඝජන්තු බිම ඇදගෙන වැටුණා!
SHATTER-CLANG!!
ස්වර්ණමාලී
"ආපසු පලයල්ලා!"
වෘක්ෂ දේවියගේ කෝපය
යුද්ධය ඇවිළෙද්දි ද්‍රෝහී සෙන්පතියා රහසින්ම රන් තෙළඹු ගස යට හාරන්න හැදුවා. ඒත් එක්කම ස්වර්ණමාලී දේවිය ගසෙන් මතු වෙලා මුල්වලින් උන්ව හිර කරගත්තා!
ජයසේනයි ගෝධයිම්බරයි එතනට කඩා පැනලා ගල් කණුව බේරගත්තා! ජයසේන ද්‍රෝහී සෙන්පතියාගේ හිස්වැසුම ගලවද්දි උගේ රතු ඇස් එළියට පෙනුණා!
KRANG-RIP!!


දුටුගැමුණු කුමරු
"එළාර රජතුමා එක්ක සටන් කරන්නේ මම විතරයි! වෙන කවුරුත් මැදිහත් වෙන්න එපා!"
DOOM! DOOM! DOOM!


රජවරුන්ගේ සටන
දකුණු දොරටුව ළඟදී කණ්ඩුලයි මහාපබ්බතයි මුහුණට මුහුණ ගැටුණා! එළාර රජුගේ හෙල්ල පහරින් බේරුණු කුමාරයා එල්ල කරපු හෙල්ල පහරින් සටන අවසන් වුණා.
THOOOOM!!


දුටුගැමුණු කුමාරයා ඇතා පිටින් බැහැලා වැටී සිටි එළාර රජතුමා ළඟ දණගැහුවේ ජයග්‍රහණයේ උදම් ඇතීමෙන් නෙවෙයි, උතුම් ගෞරවයෙන්.
එළාර රජතුමා
"සාධාරණත්වය... හැමදාම රැඳේවා!"


දුටුගැමුණු කුමරු
"අද පටන් මේ බිම පහු කරන ඕනෑම කෙනෙක් බෙර නාද නවත්තලා මේ උතුම් රජතුමාට ගෞරව කරන්න ඕනේ!"


රාජකීය සෙබළා
"රජතුමනි... ජය කොන්තය හොල්ලන්නවත් බැහැ!"
මිරිසවැටිය. රජතුමාගේ ජය කොන්තය බටහිර ගල් කණුව උඩ පැළවුණු තැන මුල්ම මහා සෑය ඉදිවුණා. ඒ එක්කම සක්වල චක්‍රයේ පළවෙනි වළල්ල දිලිසුණා!
මුතුන්මිත්තන්ගේ අනාවැකිය
මාලිගාවේ රාජකීය කරඬුව ඇරපු දුටුගැමුණු රජතුමා, තමන්ගේ මුතුන්මිත්තා වුණු දේවානම්පියතිස්ස රජතුමා රන් පතේ ලියා තැබූ අනාවැකිය කියෙව්වා!
ස්වර්ණමාලී
"ඔබ හදන මහා සෑය මගේ නමින් හඳුන්වනවා නම්, මම මේ ගෙසෙන් ඉවත් වෙන්නම්."
දුටුගැමුණු රජතුමා
"එසේම වේවා දේවියනි!"
මහා සෑය ගොඩනැගීම
දේවානම්පියතිස්ස රජතුමාගේ ගල් ටැඹේ සහ රන් පතේ සඳහන් වුණු අනාවැකියට අනුව, දුටුගැමුණු රජතුමා රුවන්වැලි මහා සෑය ගොඩනඟන්න පටන් ගත්තා!
සද්ධාතිස්ස කුමරු
"අයියණ්ඩි... අර බලන්න. මහා සෑයේ වැඩ දැන් ඉවරයි."
හාමුදුරුවන්ගේ භාඩ
"සද්ධාතිස්ස කුමාරයා සුදු රෙදිවලින් වහලා පෙන්නපු සෑය දිහා බලාගෙන, රජතුමා සැනසීමෙන් ඇස් පියාගත්තා." ඒ එක්කම සක්වල චක්‍රයේ දෙවෙනි වළල්ලත් දිලිසුණා!


ජයසේනගේ අහංකාරකම
ජයග්‍රහණයේ සාදයේදී මත් වෙලා හිටපු ජයසේන, ගෝඨයිම්බරගේ බිරිඳට නොගැළපෙන වචනයක් කිව්වා. ඒක ඇහුණු ගෝඨයිම්බර කේන්තියෙන් නැගිට්ටා.
සටන් බිමේදී ජයසේන කන්දක් වගේ උසට හිටියත්, ගෝඨයිම්බර අහසට පැනලා එල්ල කරපු වේගවත් පා පහරින් සටන එක නිමේෂයකින් ඉවර වුණා!
KRA-THWACK!!
අළු මතින් නැගිටි මහසෝනා
මීදුම පිරුණු සොහොන් පිටියේදී යක්ෂයන්ගේ අධිපති වෙසමුණි රජතුමා ජයසේනගේ කඳට වලස් ඔළුවක් සවි කළා! ගිනි අඟුරු වගේ රතු ඇස් ඇරගෙන මහසෝනා නැගිට්ටා!
වෙසමුණි රජතුමා
"අන්තිම යක්ෂ ලේ අවදි වෙන දවස වෙනකල්... මේ රිටිගල කන්ද ආරක්ෂා කරපන්!"
රිටිගල මීදුම මැදින් ඇවිදගෙන ගිය මහසෝනා, සොහොන් ගැබේ දොරටුව ඉස්සරහා නතර වෙලා අවුරුදු දෙදාහක් තිස්සේ මුරට හිටගත්තා.

නැගෙනහිර ගල් කණුව
"අවුරුදු පන්සියයකට පස්සේ... කාලවේලගේ පරණ දේවාලය යට තිබුණු අන්තිම ගල් කණුවත් දෙකට පැළුණා." පොළොව පලාගෙන මාර යානයේ සත්තු උඩට මතු වුණා!

ඒ කාලයේදීම මහසේන රජතුමා ලෝකයේ උසම ගඩොල් සෑය වුණු ජේතවනාරාමය ගොඩනඟන්න දහස් ගණන් මිනිස්සුන්ට නායකත්වය දුන්නා!

මහසේන රජතුමා
"අවසන් ගඩොලත් තියන්න!"

සෑය පාමුල අන්තිම යක්ෂ සෙබළුන් සහ මහසෝනා මාර සේනාව එක්ක සටන් කරද්දී, සක්වල චක්‍රය ළඟ හාමුදුරුවරු පිරිත් සජ්ඣායනා කරමින් ආවරණය පණ ගැන්වුවා!

ROOOAAAR!!

ඕරායන් තරු ත්‍රිකෝණය
මිරිසවැටිය, රුවන්වැලිසෑය සහ ජේතවනාරාමය කියන මහා සෑයන් තුනෙන්ම නිල් ආලෝක කඳන් අහසට විහිදුණා! ඒ ආලෝකය වැදිලා මාර සේනාවම අළු වෙලා ගියා!

හාමුදුරුවන්ගේ හඬ
"අහසේ තරු තුනයි... පොළොවේ මහා සෑ තුනයි!"

ඈත අභ්‍යවකාශයට පෙනුණු අපේ පෘථිවිය, ආයෙත් වනාවක් ඕරායන් තරු එළිය ඇතුළේ නොපෙනී සැඟවිලා ගියා.


වැඩිහිටි යක්ෂ නායකයා
"අපි දැන් මේ මිනිස්සුන්ගේ ලේ ඇතුළේ නිදාගන්නම්..."
ආරක්ෂක හාමුදුරුවෝ
"අපි මේ රහස දිවි හිමියෙන් ආරක්ෂා කරන්නම්."
හාමුදුරුවන්ගේ හඬ
"කාලයත් එක්ක ලෝකයා යක්ෂයන්ව අමතක කරලා දැම්මා... අන්තිමට ඉතිරි වුණේ ගල් කැටයම් සහ වෙස්මුහුණු විතරයි."
වර්තමානය. නව්වාට පිටිපස්සෙන් ගස් අතරින් මතු වුණු වලස් ඔළුවක් තියෙන මහා දැවැන්තයා, නව්වාගේ අතේ තිබුණු වෙස්මුහුණට හිස නමා ආචාර කළා!
හාමුදුරුවෝ
"බය වෙන්න එපා පුතේ. ජයසේන අවුරුදු දෙදාහක් තිස්සේ අපිව ආරක්ෂා කළා."
හාමුදුරුවෝ
"දැන් ආවරණය බිඳිලා ඉවරයි. ඉස්සර හිටපු රජවරුත් අද නැහැ. මේ ලෝකය රකින හතරවෙනි ගල් කණුව තමයි... ඔයා!"
මාර සේනාවේ පැමිණීම
ඈත අභ්‍යවකාශයේ මාර යානා පෙළ එකපාරටම පෘථිවිය දිහාට හැරෙද්දී, අනුරාධපුර පොළොව යට තිබුණු හෘදය යන්ත්‍රය ආයෙත් ලේ රතු පාටින් ගැහෙන්න පටන් ගත්තා!
මාර පණිවිඩය
"මාර-නවය එල්'කාර්..."
පූර්ව කතා මාලාව නිමයි. මීළඟට:
YAKKA: THE LAST BLOODLINE